# සේවක අර්ථසාධක අරමුදල
# ශ්‍රී ලංකා මහ බැංකුව

# ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය
# සහ
# වෘත්තික චර්යා ධර්ම

සංශෝධනය-2002 දෙසැම්බර්

*සැකසුම*

*අරමුදල් කළමනාකරණ ඒකකය*

*සේවක අර්ථසාධක අරමුදල*

# පටුන

## කොටස I

**අරමුදල පිළිබඳ සාමාන්‍ය විස්තර**

1. සේ.අ අරමුදලේ දැක්ම
2. සේ.අ. අරමුදලේ මෙහෙවර
3. අරමුදල පිළිබඳ සාමාන්‍ය විස්තර
4. අරමුදල් කළමනාකරණය , තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ වගකීම් හා කර්යයන් පැවරීම

## කොටස II

**ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය**

5. අරමුදලේ අභිමතාර්ථ
6. උචිත ආයෝජන වැලැක්වීම

## කොටස III

**වත්කම් වෙන්කර දීම හා සම්බන්ධ උපායමාර්ග**

7. වත්කම් වෙන්කර දීම
8. ආයෝජන කාර්යයෙන් ප්‍රමිතීන් හා මිනුම්

## කොටස IV

**අතිරේක මාර්ගෝපදේශ යෝජනා**

9. ප්‍රතිපත්ති ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය
10. වෘත්තිය චර්යාව හා චර්යාධර්මා පිළිබඳ ප්‍රමිතීන්
11. අතිරේක මාර්ගෝපදේශ - යෝජනා

## 1. අරමුදලේ කළමනාකරණය, තීරණ ගැනීම සහ වගකීම් හා කාර්යයන් පැවරීම

| | |
|---|---|
| 1. මුදල් මණ්ඩලය | ආයෝජන කටයුතු සහ අරමුදලේ භාරකාරත්වය පිළිබඳ වගකීම් දරයි. |
| 2. ආයෝජන කමිටුව | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි අරමුදල කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ හා තාක්ෂණික සහාය සැපයීමත්, මුදල් මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමත් සිදු කරයි. |
| 3. අරමුදල් කළමනාකරණ අංශය | පර්යේෂණ සිදුකිරීම, නිර්දේශ ලබාදීම සහ මුදල් මණ්ඩලයේ හා ආයෝජන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීම යන වගකීම් දරයි. |

### 1.1. මුදල් මණ්ඩලය

සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ අභිමතාර්ථය වනුයේ, සමාජිකයින්ගේ අරමුදල් ආරක්ෂා කර දීමයි. මෙය සාක්ෂාත් කරගනුයේ විචක්ෂණශීලී ආයෝජන ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීමෙන් හා ක්‍රියාවට නැංවීමෙනි.

මුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වෙයි. සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ රාජකාරී කටයුතු සහ බලතල 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5 වැනි ජේදයේ සඳහන් වේ.

ජේදය 5 (1) (C) පරිදි, අරමුදලේ භාරකාරත්වය පිළිබඳව ද ජේදය 5(1) (e) පරිදි අරමුදල් ආයෝජනය පිළිබඳවද මුදල් මණ්ඩලය වගකීම් දරයි.

ඒ පමණක් නොව ආයෝජන ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම, ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම තුලින් අවදානම පාලනය කිරීම සඳහා අරමුදල් විවිධ වත්කම් පන්ති (Asset Classes) වලට සුදුසු පරිදි බෙදා වෙන් කිරීම, සුදුසු සහ නුසුදුසු ආයෝජන නම් කිරීම සහ විවිධ වත්කම් පන්ති මත පැවරී ඇත. මෙම තීරණ ගැනීමේදී අරමුදලේ ආයෝජන අභිමතාර්ථ, ආයෝජන කාලසීමාව, මුදල් ගලාඑන ආකාරය සහ ආර්ථිකයේ විවිධ ප්‍රවණතා විශේෂයෙන් සැලකිල්ලට ගනු ලැබේ.

ආයෝජන සැලසුම මාසිකව සමාලෝචනය කිරීම සහ අනුමත කිරීමද මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. මෙම සැලසුම අරමුදල් කළමනාකරණ අංශය මඟින් පිළියෙල කරනු ලබන අතර, ආයෝජන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ. ඉදිරි මාසය තුළ මුදල් ගලා එන ආකාරය සහ ඒ අනුව නිර්දේශිත ආයෝජන මෙම සැලසුම තුළ අඩංගු වේ.

## 1.2. ආයෝජන කමිටුව

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නියමකර ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව, විචක්ෂණශීලි ආයෝජන තීරණ ගැනීමට අරමුදලට මගපෙන්වීම ආයෝජන කමිටුවේ අභිමතාර්ථයයි.

මුදල් මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද ආයෝජන කමිටුව, සේ.අ.අ. භාරව කටයුතු කරන මහ බැංකු නියෝජ්‍ය අධිපති, සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී සහ අතිරේක අධිකාරී සහ අරමුදල් කළමනාකරණ ඒකකයේ ප්‍රධානියා යන අයගෙන් සමන්විත වේ. අරමුදල් කළමනාකරණ ඒකකයේ නිලධාරියෙකු ආයෝජන කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරනු ඇත.

ආයෝජන සැලැස්ම ආයෝජන කමිටු මාර්ගෝපදේශවලට සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුරූපව හා යටත්ව ආයෝජනය පිළිබඳ කටයුතු සිදුවන බවට සහතික කරුණු පිණිස ආයෝජන කමිටුව නියාමන කටයුතු සිදුකරනු ඇත.

සේවක අර්ථසාධක අරමුල මගින් සිදුකෙරෙන ආයෝජන මුදල් මණ්ඩලය/ ආයෝජන කමිටුව විසින් කලින් කලට අනුමත කරනු ලැබිය යුතු වේ.

## 1.3. අරමුල් කලමනාකරණ ඒකකය (FMU)

අරමුදල් කලමනාකරණ ඒකකයේ අභිමතාර්ථය වනුයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වගන්ති හා ප්‍රතිපාදන වලට අනුව ප්‍රශස්ත ප්‍රතිලාභ මට්ටමක් ලැබෙන අයුරින් අරමුදල් කළමනාකරණය කිරීමයි. මුදල් මණ්ඩලයේ සහ ආයෝජන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීමද අරමුල් කළමනාකරණ ඒකකය වෙත පැවරී ඇත.

ඉහත සඳහන් කරුනුවලට අමතරව ආයෝජන හා වත්කම් වෙන්කිරීම, ගිණුම් හා නෛතික කටයුතු, ආර්ථික සාධක හා ප්‍රාග්ධන වෙළඳපොල ප්‍රවණතා පිළිබඳ පර්යේෂණ සිදු කිරීමේ සහ නිර්දේශ කිරීමේ වගකීම් ද අරමුදල් කළමනාකරණ අංශය වෙත පැවරී ඇත.

# ඡේදය II

## 2. ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය

### 2.1. අරමුදලේ ආයෝජන අභිමතාර්ථයන්

අරමුදලේ ප්‍රධාන අභිමතාර්ථය වනුයේ දළ ජාතික නිශ්පාදිතයේ පහත වැටීම් (GDP Deflator) අනුව ගණන් බලා ඇති වාර්ෂික සාමාන්‍ය උද්ධමනය අභිබවා 4% ක මූර්ත ලාභ ප්‍රතිශතයක් උපයාගැනීමයි. සේ.අ.අ. ඇතැම් නෛතික හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට යටත්ව නියම කළ දායකත්ව සැලසුමක් (Defined Contribution Plan) වන බැවින්, පූර්ණ ප්‍රතිලාභ නියමිත කාලයට ලබාදීම සහතික කරන අතරට ආයෝජන කළඹෙහි අවදානම සාමාන්‍ය මට්ටමට වඩා පහලින් පවත්වා ගැනීම ද සිදු කළ යුතුව ඇත.

අරමුදලේ දිගු කාලින අරමුණු සාක්ෂාත් කර ගැනීමට යාමේදී වරින්වර පැන නැගිය හැකි සෘණ මූර්ත ප්‍රතිලාභ ප්‍රතිශත සාධාරණීකරණය කළහැකි නමුත් දිගුකාලින අනුයාත සෘණ මූර්ත ප්‍රතිලාභ ප්‍රතිශතවලට ඉඩ නොතැබිය යුතුය.

අරමුදලේ මූලික අරමුණු සහ ඉලක්ක සපුරා ගත හැකි වන පරිදි අවදානම සහ ප්‍රතිලාභ ප්‍රශස්ත මට්ටමක පවත්වා ගෙන යා හැකි නම් රාජ්‍ය හෝ පෞද්ගලික යන කවර අංශයක වුවද ආයෝජනය කිරීමට අවසර තිබේ.

### 2.2. සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන කාලසීමාව

ආයෝජනවල කල්පිරීම් ඇතුළු මුදල් ගලා ඒම් ප්‍රතිලාභ ගෙවීම්, ආදායම් බදු සහ වෙනත් විය හියදම් වැනි මුදල් ගලායාම් සමඟ ගැලපිය යුතුය. පුරෝකථනවලට අනුව මේ වන විට අරමුදලට ගලාඑන මුදල් ප්‍රමාණය අරමුදලෙන් ගලායන මුදල් ප්‍රමාණයට වඩා වැඩි වන අතර පුරෝකථනවලට අනුව ඉදිරි වර්ෂ 5 තුළදී ද නොවෙනස්ව පවතිනු ඇත. එබැවින් අරමුදලට සාමාන්‍ය මට්ටමේ අවදානමක් දැරීමේ හැකියාව සහිත දිගුකාලින ආයෝජන කාලසීමාවක් තිබේ. මේ අනුව සේවක අර්ථසාධක අරමුදලට සාමාජිකත්වයේ සැලකිය යුතු පහත වැටීමක් නොමැති සදාකාලික පැවැත්මක් ඇත.

සැලකිය යුතු අක්‍රිය සාමාජික ගිණුම් සංඛ්‍යාවක් තිබීම අරමුදලට සෘණ ප්‍රතිලාභ ඇතිවීමට එරෙහිව අමතර ආරක්ෂාවක් සලසයි. එහෙත් වාර්ෂික ප්‍රතිලාභ ගෙවීම් ඉහළ යාමේ ප්‍රතිශත ඇතුළු අරමුදලේ අනාගත වගකීම් ප්‍රමාණය සහ කාලසීමාවන් පිළිබඳව නිවැරදි ඇගයීමක් මේ දක්වා සිදු කර නොමැත.

## 2.3. සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජනවලට අදාළ සීමාවන්

අරමුදල කළමනාකරණයේදී ආයෝජන කමිටුව අරමුදල් කලමනාකරණ අංශය සහ ආයෝජන කාර්ය මණ්ඩලය සැම විටම මුදල් මණ්ඩලය සහ ආයෝජන කමිටුව විසින් කලින් කලට පනවනු ලබන පහත සඳහන් මාර්ගෝපදේශ සහ සේ.අ.අ පණත හා ආයෝජන - ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් පනවා ඇති පරිපාලන හා නෛතික සීමාවන් ඇතුළු අනිකුත් නෛතික අවශ්‍යතාවයන් අනුගමනය කිරීමට බැඳී සිටිය යුතුය.

## 2.4 ද්‍රවශීලතා අවශ්‍යතා

ප්‍රතිලාභ ගෙවීම්, නිවාස ණය ඇපකර සඳහා වන ගෙවීම් සහ දෛනික වියහියදම් ආදිය, සම්පූර්ණයෙන් හා නිසිකලට පියවීම සඳහා අරමුදලට ද්‍රවශීලතාව අවශ්‍ය වේ.

දායක මුදල් හරහා අරමුදලට ගලා එන මුදල් ප්‍රමාණය ප්‍රතිලාභ ගෙවීම් ප්‍රතකිලාභ වලට වඩා ඉහළ අගයක පවතින බැවින් ද්‍රවශීලතාවයේ අවශ්‍යතාවය ඉතා අවම වේ. ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත්වල රුපියල් බිලියන 5ක උපරිම ආයෝජනයක් නිරතුරුව පවත්වාගෙන යනු ලැබේ.

ප්‍රතිවිකුණුම් (Repo) ආයෝජන ඇතුළු අනෙකුත් කෙටිකාලීන ආයෝජන ද ද්‍රවශීලතා අවශ්‍යතා සම්බන්ධයෙන් ආරක්ෂණයක් සපයයි.

## 2.5. බදු ගෙවීම්

දේශිය ආදායම් පනතේ වගන්ති ප්‍රකාර අරමුදල එහි දල ආයෝජනය මත 10% ක ආදායම් බදු ගෙවිය යුතු වේ. අරමුදලේ අපේක්ෂිත දල ආදායමේ පදනම මත කාර්තු වශයෙන් ආදාම් බදු ගෙවිය යුතු අතර, අවසාන ගෙවීම ඊලඟ වර්ෂයේ ප්‍රථම කාර්තුව තුළ ගෙවා අවසන් කළ යුතුය.

## 2.6. නෛතික / පරිපාලනමය අවශ්‍යතා

### 2.6.1. නෛතික අවශ්‍යතා

**2.6.1.1.** සේවක අර්ථසාධක අරමුදල් පණතේ 14 (1) ඡේදයට අනුව අරමුදල අවම වශයෙන් වාර්ෂිකව 2.5% ක ලාභාංශයක් (Credit) – ප්‍රකාශයට පත්කළ යුතුය.

**2.6.1.2.** මුදල් මණ්ඩලයේ විශේෂ පූර්වලිඛිත අනුමැතියකින් තොරව පහතදැක්වෙන වර්ගවලට අයත් ,ආයෝජන වලට අවසර නොලැබේ.

- ❖ විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන්
- ❖ ව්‍යුත්පන්න සුරැකුම්පත් (Dertvatives)
- ❖ විදේශ විනිමය සහ වෙළඳ භාණ්ඩ (උදා. ලෝහ, ඉන්ධන, කෘෂි භාණ්ඩ, පශු සම්පත්)
- ❖ දේපොළ කොටස් (Real estate equity)
- ❖ ලියාපදිංචි නොකළ හෝ සීමාකරණ ලද සුරැකුම් පත්
- ❖ ණය ලබා ගැනීම්
- ❖ ණයට ගෙන විකිණීම් (Short Selling)
- ❖ අවසර නොලද සුරැකුම්පත් වලට එරෙහි ප්‍රතිමිලදී ගැනුම්.

**2.6.1.3.** අරමුදලේ වත්කම්වල වෙළඳ වටිනාකම් වල ක්ෂය වීම් හා අහම්බයන් (Contingencies) වලට මුහුණදීම සඳහා අරමුදලේ ආදායමෙන්, සංචිත ස්ථාපනය කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

### 2.6.2. <u>පරිපාලනමය අවශ්‍යතා</u>

**2.6.2.1.** සාංගමික ණයකරවල ආයෝජන සඳහා මග පෙන්වීම්

- ❖ බලයලත් තක්සේරු ආයතනයක් (Rating Agent) විසින් ණයකර නිකුතුව තක්සේරු කළයුතු අතර පොලී අනුපාතිකය,අවදානමට සරිලන පරිදි විය යුතුය. "B B B " ප්‍රමාණයට වඩා අඩු ණයකර නිකුතුවල ආයෝජනය කිරීමට අරමුදලට බලය නොමැත.

❖ පොලිය හෝ ප්‍රාග්ධන ගෙවීම් පැහැර හැරීමක් සිදුවුවහොත්, නිකුත් කරන සමාගම සේ.අ.අ. විසින් නියමකරනු ලබන දඩ මුදල් (Default payment charges) ගෙවීමට එකඟ විය යුතුය.

❖ නිකුත්කරන්නා පොදු සීමාසහිත සමාගමක් විය යුතු අතර කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි නිකුතු වලට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. කල් පිරීමේ කාලය, මිල හෝ පොලී ප්‍රතිශතය සහ මුළු ආයෝජනය, මුදල් මණ්ඩලය විසින් අනුමත කළයුතු වේ.

❖ ආයෝජන සුරැකුම්පත්, ප්‍රාග්ධන අලාභයක් ඇතිව විකිණිය නොහැක. එවැනි අවශ්‍යතාවයක් පැනනැගුනුහොත් ආයෝජන කමිටුව විසින් පූර්ව අනුමැතිය ලබාදිය යුතුවේ.

**2.6.2.2. සාමාන්‍ය කොටස්වල ආයෝජනය**

❖ ආයෝජන කමිටුව එකඟ වුවහොත් මිස, ඕනෑම සමාගමක ආයෝජනය, එහි ප්‍රාග්ධන කොටස් නිකුතුවෙන් 5% නොඉක්මවිය යුතු වේ.
 මෙම තීරණයට හේතුවනුයේ,
 (a) ප්‍රමාණවත් නොවන ද්‍රවශීලතාවක් නොමැති වීම.
 (b) අරමුදල මඟින් සමාගම් පාලනය කිරීම වැලැක්වීම

❖ අරමුදලට ලැබෙන ප්‍රතිලාභය ඉහල නැංවීමේ අභිප්‍රායෙන් පමණක්ම මිස සමාගම පාලනය නොකිරීමට අරමුදල වගබලා ගත යුතුය. ආයෝජන කමිටුවේ තීරණය පරිදි ආයෝජිත සමාගම් වල වාර්ෂික මහ සභා රැස්වීම් වලදී ඡන්දය පාවිච්චි කිරීමට අරමුදලට අවසර තිබේ.

❖ මුදල් මණ්ඩලය විසින් සේ.අ.අ. බැංකු සහ මූල්‍ය ආයතන අධීක්ෂණය කරනු ලබන බැවින් බැංකු සහ මූල්‍ය ආයතනවල ව්‍යාපාර වස්තුවල ආයෝජනය කිරීමට අරමුදලට අවසර නොමැත. නමුත් බැංකු හා මූල්‍ය ආයතනවල ලැයිස්තුගත නොවූ කොටස්වල ආයෝජනය කිරීම සඳහා පහත සඳහන් අවස්ථාවලදී අවසර තිබේ.

 (a) දිගුකාලීන ආයෝජන අරමුණු සහිත නව ආයෝජන ආයතන වල.

(b) ආයෝජන ගිණුම අක්‍රියව (Passive) කළමනාකරණය කරනු ලබන විට.

- ❖ සාමාන්‍ය සහ වරණීය කොටස්වල ආයෝජනය කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත ප්‍රසිද්ධ සමාගම් (Blue Chip) වලට සීමා විය යුතුය.

- ❖ ආයෝජන කමිටුවට නිර්දේශ කිරීමට පෙර අරමුදල් කළමනාකරණ අංශය, සමාගම් පිළිබඳව හා ඒවායේ අනාගත පැවැත්ම හා සබැඳි සාධක පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කළ යුතුය වේ.

## කොටස III

## 3. වත්කම් බෙදා වෙන්කරීම හා සබැඳි ක්‍රමෝපායයන්

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වැදගත්ම කොටස වනුයේ වත්කම් බෙදා වෙන් කිරීම වන අතර ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව එය වාර්ෂිකව සකස් කළ යුතුය.

### 3.1. වත්කම් වෙන්කිරීම

සේ.අ.අ.ලේ වත්කම් බෙදා වෙන්කිරීමේ ප්‍රතිපත්තියේ මූලික අභිමතාර්ථය වනුයේ අරමුදලට පිළිගත හැකි පරාසයක් තුළ අවදානම් කළමනාකරණය කරමින් ඉහලම මට්ටමේ ආයෝජන ප්‍රතිලාභ ලබාගැනීම සඳහා උපක්‍රමික වශයෙන් සුදුසුම වත්කම් පන්ති මිශ්‍රණය සකස් කිරීමයි.

## 4. වත්කම් පන්ති මාර්ගෝපදේශ

### 4.1 දේශීය ව්‍යාපාර කොටස්වල ආයෝජනය

#### 4.1.1 ව්‍යාපාර කොටස් කළඹ කළමනාකරණය

සමස්ථ ආයෝජනයන්ගේ මුළු වටිනාකමින් 2% ක උපරිමයක් දක්වා වන පරිදි ව්‍යාපාර කොටස්වල ආයෝජන පවත්වා ගනු ලැබේ.

ආයෝජන කමිටුවේ සහ මුදල් මණ්ඩලයේ සමාලෝචනයට හා නිර්දේශ වලට යටත්ව අරමුදල් කළමනාකරණ අංශයේ අභිමතය පරිදි අදාළ ප්‍රතිශතය උච්චාවචනය කළ හැකිය.

අවශ්‍යතාවය අනුව සක්‍රිය හෝ අක්‍රිය උපායමාර්ගවලට අනුව ව්‍යාපාර කොටස් කළමනාකරණය කළ හැක. කෙසේවුවත් දේශීය කොටස් වෙළඳපොලේ පහත් දුවශීල තත්වය හේතුවෙන් අක්‍රිය කළමනාකරණය එතරම් ප්‍රඥාගෝචර නොවේ.

### 4.1.2 ආයෝජන හා සම ආයෝජන අභිමතාර්ථ

ව්‍යාපාර කොටස්වල ආයෝජනය පිළිබඳ මූලික අභිමතාර්ථය වනුයේ දිගුකාලීන ප්‍රාග්ධන වර්ධනයක් ඇතිකර ගැනීමේ අදහසින් වෙළෙඳ පොළට වඩා වැඩි ප්‍රතිලාභ උපයාගැනීමය. මෙම අභිමතාර්ථය සපුරාගැනීමට ආයෝජන කමිටුව සහ අරමුදල් කළමනාකරණ අංශය මෙම වාර්තාවේ 7.3.6 කොටසේ සඳහන් පරිපාලනමය අවශ්‍යතාවලට අනුව ක්‍රියා කළයුතුය. එපමණක් නොව ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයට සහ මුදල් මණ්ඩලය /ආයෝජන කමිටුව විසින් පනවනු ලබන මාර්ගෝපදේශයන්ට අනුව ව්‍යාපාර කොටස් කළමනාකරණය කළ යුතුය. ව්‍යාපාර කොටස් යන්නෙන් සමාන්‍ය කොටස්, වරනීය කොටස් සහ පරිවර්තනය කළ හැකි සුරැකුම්පත් (Converterble Securities) අදහස් වේ.

### 4.1.3. තැරැව්කරුවන් සහ ගනුදෙනු සිදු කිරීම

කිසිදු දේශීය කොටස් තැරැව්කාර සමාගමකට විශේෂ සැලකිල්ලක් ලබා නොදිය යුතු අතර, දේපාර්ශ්වය විසින් ඇති කර ගන්නා ලද ගිවිසුමට අනුව ඩොයිෂ් බැංකුව විසින් අරමුදලට භාරකාරා සේවාවක් (Custodian Service) සපයනු ලැබේ.

## 4.2 ස්ථාවර ආදායම් ආයෝජන (Fixed Income Investments)

### 4.2.1 ස්ථාවර ආදායම් ආයෝජන කළඹ කළමනාකරණය

සමස්ථ අරමුදලෙන් 90%ක අවම වෙළෙඳ පොළ වටිනාකමකින් යුත් ස්ථාවර ආදායම් කළඹක් පවත්වා ගත යුතුය. මුදල් මණ්ඩලයේ සහ ආයෝජන කමිටුවේ නිර්දේශයක් හා සමාලෝචනයන්ට අනුව අරමුදල් කළමනාකරණ අංශයේ අභිමතාර්ථය පරිදි අදාළ ප්‍රතිශතය උච්චාවචනය කළ හැකිය

අරමුදලෙන් වටිනාකමෙන් 10% කට වඩා වැඩි ප්‍රමාණයක් අවදානම් සහිත සාංගමික ණයකර වෙළඳපොලේ ආයෝජනය කළ නොහැක.

සාංගමික ණයකර, ස්ථාවර ආදායම් සුරැකුම්පත් යටතට වැටෙන අතර, ඒවායේ ආයෝජනයේදී මෙම වාර්තාවේ 5II කොටසේ දක්වා ඇති මාර්ගෝපදේශයන් පිළිපැදිය යුතුය.

#### 4.2.2 ආයෝජන උපකරණ හා ස්ථාවර ආදායම් ආයෝජන කළඹෙහි අභිමතාර්ථ

මෙම ආයෝජන කළඹෙහි මූලික අභිමතාර්ථය වනුයේ අරමුදලට ධනාත්මක මුදල් ප්‍රවාහයක් උපයාගැනීමයි. මෙමඟින් ආවරණය වනුයේ,

(a) භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රතිවිකුණුම් හැර ලංකාණ්ඩුව විසින් නිකුත් කරන සුරැකුම්පත්.

(b) දේශිය සාංගමික බැඳුම්කර, උදා: ණයකර සහ වෙනත් දිගුකාලින ආයෝජන උපකරණ.

### 4.3 මුදල් සමකයන් (Cash Equivalents)

#### 4.3.1 මුදල් සමකයන් ,කළමනාකරණය

කිසිම විටෙක මුදල් හා මුදල් සමකයන් සමස්ථ ආයෝජනයෙන් 10% නොඉක්මවිය යුතු අතර, එවැනි ඉක්මවායෑම් ඇතිවෙන විටෙක එය ආයෝජන කමිටුව විසින් අනුමත කළ යුත්තේය. අසම්භාව්‍ය ගෙවීම් (Contingencies) බේරුම්කිරීම සඳහා ඕනෑම අවස්ථාවක රුපියල් බිලියන 5ක වටිනාකමින්යුත් භාණ්ඩාගාර බිල්පත්, රඳවා තබා ගැනීමට අරමුදලට අවසර තිබේ.

#### 4.3.2 ආයෝජන උපකරණ හා ආයෝජනවල අභිමතාර්ථ

කෙටිකාලින ආයෝජන උපකරණ මධ්‍යස්ථව (Conservative) ආයෝජනය කළයුතු අතර සහ අනපේක්ෂිතව අරමුදලට සිදුවන යම් යම් මුදල් ගෙවීම් සඳහා යොදා ගැනීමත් අනාගත ආයෝජන සඳහා අවශ්‍ය සංචිත ඇති කර ගැනීමත් අපේක්ෂා කෙරේ. වසරකට වඩා අඩු කෙටිකාලින ආයෝජන, භාණ්ඩාගාර බිල්පත් වාණිජ ලියවිලි, (Commercial Papers), භාර සහතික පත්‍ර (Trust Certificates) සහ ප්‍රතිවිකුණුම් මුදල් සමක යන්නෙන් ආවරණය වේ.

## 5. ආයෝජන කාර්ය සාධනයේ ප්‍රමිතීන් හා මිනුම්

ආයෝජන කාර්ය සාධනය, මාසිකව සමාලෝචනය කරනු ලබන අතර කාර්තුවෙන් කාර්තුවට ඇගයීමට භාජනය කෙරේ. ආයෝජන කාර්ය සාධනය, වත්කම් පන්ති

ඇගැයීමට  භාවිත කළහැකි පොදු දර්ශක සමග සංසන්දනය කෙරේ. පහත දැක්වෙන පරිදි ආයෝජන උපකරණ ඇගැයීමට භාජනය කෙරේ.

I. <u>ව්‍යාපාර කොටස් වෙළඳපොල</u>

ද්‍රවශීල බවින් අධික ,විශාල වශයෙන් ප්‍රාග්ධනීකරණය වූ ව්‍යාපාර වස්තු විලංකා මිළ දර්ශකය සමඟ සංසන්දනය කෙරෙන අතර, සෙසු ආයෝජන සමස්ථ කොටස් මිල දර්ශකය සමඟ සංසන්දනය කෙරේ. අදාළ කාලපරිච්ඡේදය සඳහා ලද ලාභාංශද සැලකීමට භාජනය කෙරේ.

II. <u>ස්ථාවර ආදායම් සුරැකුම්පත්</u>

ස්ථාවර ආදායම් සුරැකුම්පත් ඇගයීමට භාජනය කළ කාල පරිච්ඡේදය තුළ වෙළඳපොළේ ගනුදෙනු වූ ඒ හා සමාන ආයෝජන උපකරණ සමඟ සංසන්දනය කෙරේ.

උදාහරණ වශයෙන්  ප්‍රථමික වෙළඳපොලේ  බර තැබූ භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාත අදාළ කාලය සඳහා සේ.අ.අ. උපයාගත් ලාභ අනුපාතය  සමග සංස්නදනය කරනු  ලැබේ.

## 6. ප්‍රතිපත්ති ප්‍රකාශනය කලින් කලට සමාලෝචනය කිරීම

වාර්ෂිකව සහ අවශ්‍ය වූ විටෙක ප්‍රතිපත්ති ප්‍රකාශනය මුදල් මණ්ඩලය විසින් සමාලෝචනය  කෙරේ. අරමුදලේ  සාමාජිකයින්ගේ යහපත වෙනුවෙන්, නෛතික හෝ විචක්ෂණයශීලි  කරුණු හා බැඳුන අවශ්‍යතාව මත, අන්තර්ගතයේ සංශෝධන සිදුකෙරේ. කෙසේ වෙතත්  එබඳු සංශෝධන  දිගුකාලීන හා ක්‍රමික ලෙස සැලසුම් කෙරේ.

ප්‍රාග්ධන වෙළඳපොලේ සිදුවන කෙටිකාලීන සිදුවීම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සැල්කිල්ලට භාජනය නොකෙරේ.

## 7. වෘත්තික චර්යාවේ ප්‍රමිතීන් හා ආචාරධර්ම

ආයෝජන කමිටු සමාජිකයින්, අරමුදල් කළමනාකරණ කාර්ය මණ්ඩලය වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනයේ (CFA Institute) ආචාරධර්ම සංග්‍රහය අන්තර්ග්‍රහණය කර ගෙන ඇත.

8. අතිරේක මාර්ගෝපදේශ /යෝජනා

ආයෝජන කමිටුවේ සාමාජිකයින් අරමුදල් කළමනාකරණය අංශය තමන්ට හා තම සමිතම පවුලේ සාමාජිකයින්ට අයත් ආයෝජන හා සියළු සක්‍රිය ව්‍යාපාර සම්බන්ධතා පිළබඳව අනාවරණය කිරීම සඳහා ප්‍රකාශනයක් වාර්ෂිකව සම්පූර්ණ කර ආයෝජන කමිටුව ඔස්සේ මුදල් මණ්ඩලයට ඉදිරිපත් කළයුතුය.

පවතින වෙළඳපොල තත්ත්වය අනුව අරමුදලේ මුළු වටිනාකම ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම ගැටළුවක් වී නැත.

නමුත් ශ්‍රී ලංකා ආණ්ඩුව දේශීය වෙළඳපොලෙන් ගනු ලබන ණය ප්‍රමාණය අඩුවවුහොත් එය අරමුදලට බරපතල ගැටළුවක් වීමට හේතුවක් විය හැකිය.

සංවර්ධනය නොවූ සාංගමික ණය වෙළඳපොල හා දේශීය කොටස් වෙළඳපොල හේතුවෙන් මෙම තත්වය  තවදුරටත් අයහපත් අතට හැරෙනු ඇත.

සාම ක්‍රියාමාර්ගය සාර්ථක වුවහොත් ආණ්ඩුවේ ණය ගැනීම් සැලකිය යුතු මට්ටමකින් පහත වැටෙනු ඇත. එය අරමුලේ පොලී අනුපාතිකය හා ස්ථාවර අදායම් ආයෝජනය කෙරෙහි බලපානු ඇත.

මෙම ගැටළු තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා අරමුදල තම ආයෝජන කළඹ දිගුකාලීන දැක්මකින් විවිධාංගීකරණය කළ යුත්තේය.  ඒ සමගම විදේශ වෙළඳපොලේ ආයෝජනය කිරීමට සහ දේශීය කොටස් වෙළඳපොලේ බැංකු කොටස්වල ආයෝජනයට ඉඩ කඩ ලැබෙන පරිදි සේ.අ.අ පනත සංශෝධනය කිරීමද අත්‍යවශ්‍ය වේ.  තවදුරටත් බාහිර මානව සම්පත්වල සේවය ලබා ගන්නා අතරතුර ජාත්‍යන්තර ආයෝජන හැසිරවීම පිළබඳව සේ.අ.අ. කාර්ය මණ්ඩලය පුහුණු කිරීමද අරමුදල විසින් කළ යුතුය.